# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1650/24 - 2010 අප්‍රේල් 22 වැනි බ්‍රහස්පතින්දා - 2010.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1992 අංක 59 දරන සත්ව රෝග පනත**

ප්‍රකාශනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ හා මැදමහනුවර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාස තුළ සිටින ගවයන් අතරේ කුර හා මුඛ රෝගය පැතිරී ඇති හෙයින්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් අලවත්තගේ දොන් නිමල් චන්ද්‍රසිරි වන මා විසින් 1992 අංක 59 දරන සත්ව රෝග පනත යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, පහත දැක්වෙන මායිම් තුළ පිහිටි ප්‍රදේශය "ආසාදිත ප්‍රදේශයක්" ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

*නැගෙනහිර* : උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බටහිර මායිම ;

*බස්නාහිර* : පහතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිණිකොන මායිම හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඊසාන මායිම ;

*උතුරට* : පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු මායිම ;

*දකුණ* : පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඊසාන මායිම හා හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරු මායිම

මෙම ප්‍රකාශනය ඉවත් කරන තුරු මෙම ප්‍රදේශය තුළට හෝ ඉන් පිටතට ගවයන් හෝ කරත්ත ප්‍රවාහනය කිරීමට ඉඩ දෙනු නොලබන බවට 5 (3) වන නියෝගය යටතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල් අලවත්තගේ දොන් නිමල් චන්ද්‍රසිරි වන මා විසින් මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ.

"ආසාදිත ප්‍රදේශයක්" තුළ දී තැනැත්තන් විසින් ගැනීමට අවශ්‍ය වන පියවරවල් නීතියෙන් නියම කරනු ලබන 1992 අංක 59 දරන සත්ව රෝග පනත වෙත මෙම ප්‍රදේශය තුළ සිටින සියලුම ගව අයිතිකරුවන්ගේ සහ කරත්තකරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. මෙම නියෝග පිළිබඳ විස්තර කුණ්ඩසාලේ හා තෙල්දෙණියේ රජයේ පශු වෛද්‍යවරුන්ගෙන් හෝ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලවලින් ලබා ගත හැකි ය.

මෙම ප්‍රකාශනය මෙහි සඳහන් දින සිට බල පැවැත්වේ.

අලවත්තගේ දොන් නිමල් චන්ද්‍රසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

2010 අප්‍රේල් මස 22 වැනි දින,
පේරාදෙණිය,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ,
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ දී ය.

05 - 104


1A - G 12726— 335 (2010/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.